# තිරසාරත්වය පිළිබඳ බැඳීම
# H&M ව්‍යාපාරික හවුල්කරු

**H&M ව්‍යාපාරය තුළ, තිරසාරත්වය සාර්ථක ව්‍යාපාරයක ස්වාභාවික කොටසක් බව අපට ඒත්තු ගන්වා ඇත. එමනිසා, අපි සදාචාරවත් අයුරින් විනිවිදභාවයෙන් සහ වගකීමෙන් කටයුතු කිරීමට සැමවිටම වෙහෙස ගන්නා අතර අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් එසේ කටයුතු කරන්නේයයි අපි බලාපොරොත්තු වෙමු. H&M විසින් H&M සමූහය තුළ සියලූම අනුබද්ධිත සමාගම් සහ වෙළෙඳ නාම නියෝජනය සිදු කරනු ලබයි.**

**නීතියට අනුකූලතාව දැක්වීම මූලික ආරම්භක කරුණක් වුවද, අපගේ අභිලාෂය වන්නේ පහත කරුණු දියුණු කිරීමට නීතියෙන් දක්වා ඇති දෙයින් ඉදිරියට යාමයි ;**

**යහපත් සේවා ස්ථාන:**විසින් ආදායම් සැපයීමට අමතරව සේවකයින්, ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන් සමෘද්ධිමත් කිරීමට ශක්තිය ලබා දේ. රැකියා සහ ව්‍යවසාය සංවර්ධනය ඇති කරන තිරසාර ආර්ථික වර්ධනය සඳහා ආරක්ෂිත සහ යහපත් සේවා ස්ථානයක් ලබාදීම, සේවක හිමිකම් ආරක්ෂා කිරීම, සේවකයින්ගේ මූලික අවශ්‍යතා සපුරාලන ජීවත්වීමට සාධාරණ ජීවන වැටුපක් ගෙවීම සහ සමාජීය සාකච්ඡාවන් ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**යහපත් පරිසර පද්ධති:** පරිසර පද්ධති විසින් ජනතාවට, ප්‍රජාවන්ට සහ ව්‍යාපාරයන්ට අත්‍යවශ්‍ය වන පිරිසිදු වාතය, ජලය වැනි ස්වභාවික සම්පත් අප වෙත ලබා දේ. වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා, පරිසරයට සිදුවන හානි වළක්වමින් සහ ස්වභාවික සම්පත් වගකීමෙන් භාවිතා කරමින් පරිසර පද්ධතිවල දිගු-කාලීන යහපත්භාවය ආරක්ෂා කළ යුතුය.

**සත්ත්ව ශුභසාධනය:** කාරුණිකව සැලකීම සඳහා සතුන්ට හිමිකම ඇත. යහපත් සත්ත්ව පාලනය සහ සත්ත්ව නොවන පරීක්ෂණ ක්‍රම යොදා ගැනීම තුළින් මෙයට ගරු කළ යුතුය.

මෙම බැඳීම තුළ දක්වා ඇති අවශ්‍යතාවන් සහ ප්‍රවේශය ව්‍යාපාරික හවුල්කරුවන් විසින්ද තමන්ගේ සැපයුම් දාමයන් තුළ යොදා ගත යුතු යැයි H&M අපේක්ෂා කරයි.
H&M සියලූම වර්ගයේ දූෂණ පිළිබඳ ශූන්‍ය මට්ටමේ සහන ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර ශක්තිමත් දූෂණ විරෝධී වැඩසටහනක් සඳහා බැඳී සිටී.
ආචාර ධර්ම සංග්‍රහය/ ව්‍යාපාරික හවුල්කාර බැඳීම සියලූම ව්‍යාපාරික හවුල්කරුවන් විසින් අත්සන් කළ යුතු සහ පිළිපැදීමට බැඳී සිටින වෙන් වූ බැඳීමකි.
මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම තුළින් පහත කරුණු ආවරණය කෙරේ:

| **1. යහපත් සේවා ස්ථාන** | **2.යහපත් පරිසර පද්ධති** | **3.සත්ත්ව ශුභසාධනය** |
|---|---|---|
| ‘ සෞඛ්‍ය සහ ආරක්ෂාව<br>‘ වෙනස්කම් සැලකීම, විවිධත්වය සහ සමානත්වය<br>‘ පිළිගත් රැකියාව<br>‘ සාධාරණ ජීවන වැටුප, ප්‍රතිලාභ සහ වැඩකරන පැය ගණන්<br>‘ රැස්වීමේ නිදහස සහ සාමූහිකව කේවල් කිරීමේ අයිතිය<br>‘ ළමා ශ්‍රමය සහ තරුණ සේවකයින්<br>‘ බලාත්කාර ශ්‍රමය | ‘ කාලගුණය සහ වායුවල තත්ත්වය මත බලපෑම<br>‘ ජල සම්පත් මත බලපෑම<br>‘ රසායනික ද්‍රව්‍ය භාවිතය<br>‘ අපද්‍රව්‍ය, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය<br>‘ විශේෂක සහ ස්වභාවික ජන්මභූමි සංරක්ෂණය | ‘ සත්ත්ව පාලනය<br>‘ සත්ත්ව පරීක්ෂාව |

මෙම කරුණු සම්බන්ධයෙන් H&M හි අවශ්‍යතාවන සහ අපේක්ෂාවන් මෙම බැඳීමේ පිරිවිතර කොටසේ පැහැදිලි කෙරේ. සෑම කරුණක් සඳහාම, තිරසාරත්ව කාර්යසාධන මට්ටම් දෙකක් ඇත;

‘ **මූලික–**එක්සත් ජාතීන්ගේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතිවලට මෙන්ම ජාතික ව්‍යවස්ථා සම්පාදනයට අදාළවන්නා වූ අන්තර්ජාතිකව පිළිගත් සම්මතවලට අනුව කාර්යය ඉටුකිරීම මින් අදහස් වන අතර සේවකයින් සඳහා ඉහල ආරක්ෂාවක් ලබාදෙන අවශ්‍යතාවන් අතර වෙනසක් ඇති අවස්ථාවක, පරිසරය සහ සත්ත්ව ශුභසාධනය යොදා ගැනේ. මූලික අවශ්‍යතාවයන් හා අනුකූලවීම සියලූම H&M ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ.

‘ **අපේක්ෂිත–**ව්‍යාපාරික හවුල්කරුවන්ගේ මෙහෙයුම්වල තිරසාරත්ව බලපෑම් දියුණුකිරීම සඳහාවන මූලික මට්ටමේදී මෙන්ම ඔවුන්ගේ මෙහෙයුම්වලින් පරිබාහිර සමාජීය හා පාරිසරිකමය ගැටළු ආමන්ත්‍රණය කිරීමට දායක වීමේදී නෛතික වගකීම සහ ජාත්‍යන්තර සම්මතවලට වඩා ඉදිරියට යන කාර්යය ඉටුකිරීම මින් අදහස් වේ.

මෙම ක්ෂේත්‍ර තුළ කර්යසාධනය, ව්‍යාපාරික හවුල්කරුවන් පිළිබඳ H&M හි සමස්ත ඇගයීම තුල අත්‍යවශ්‍ය සංරචකයකි. තිරසාරත්වය දියුණු කිරීම සඳහා වන අපගේ අභිලාෂය සහ අඛණ්ඩ වර්ධනය සඳහා වන අපගේ බැඳීම බෙදාගන්නා ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම, වර්ධනය වීම සහ ත්‍යාග පිරිනැමීම අපි අඛණ්ඩව සිදු කරමු. මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම H&M සමග ගිවිසුම්ගත ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ඍජු මෙහෙයුම්වලට සහ උප කොන්ත්‍රාත්කරුවන්ට අදාළ වේ. වර්ධිත තිරසාරත්ව කාර්යසාධනය සඳහා එකට වැඩ කිරීම පිණිස මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම ස්වේච්ඡාවෙන්ම අත්සන් කරන සැපයුම් දාමය තුළ වක්‍ර ව්‍යාපාරික හවුල්කරුවන් සමග ද H&M කටයුතු කළ හැකිය.

# තිරසාරත්වය පිළිබඳ බැඳීම සඳහා වූ පිරිවිතර H&M ව්‍යාපාරික හවුල්කරු

## අපගේ පිරිවිතර සඳහා පදනම්

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, වැඩපොළේදී මූලික මූලධර්ම සහ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශනය සහ ව්‍යාපාරික සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්ම ඇතුළු ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන අපගේ බැඳීම මෙම පිරිවිතරවලින් පිළිබිඹු කෙරේ. මානව අයිතිවාසිකම්, පරිසරය සහ සත්ත්ව ශුභසාධන ගැටළු පිළිබඳ බහු පාර්ශවික සම්මුති සහ බහු-පරදු දරන්නන්ගේ ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ පිළබඳව ද මෙම පිරිවිතර තුළ අවධානය යොමු කෙරේ.

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් බොහෝමයක් ඔවුන්ගේ මෙහෙයුම්වල සහ සැපයුම් දාමයන් තුළ මෙම ප්‍රමිතීන් පිළිගැනීමට සහ ප්‍රවර්ධනය කිරීමට බැඳී සිටින බව අපි දනිමු. එමෙන්ම, අපගේ පිරිවිතරවල සමහර අංගයන් අපගේ සේවා ව්‍යාපාරික හවුල්කරුවන්ට වඩා අපගේ නිෂ්පාදනය ව්‍යාපාරික හවුල්කරුවන්ට වඩාත් අදාළ වන බව අපි පිළිගනිමු. සාකල්‍ය ආකෘතියකින් පිරිවිතර ඉදිරිපත් කිරීමේදී අපගේ ඉලක්කය වන්නේ අපගේ අවශ්‍යතාවන් පිළිබඳව සියලුම ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා පැහැදිලි සහ ප්‍රමාණවත් විස්තර සැපයීමයි.

## කාර්යසාධනය ඇගයීම

H&M හි තිරසාරත්ව කාර්යසාධනය තුළ අඛණ්ඩ වර්ධනයන් පෙන්නුම් කරන ව්‍යාපාරික හවුල්කරුවන් සමග අඛණ්ඩව වර්ධනය වීම පිළිබඳ ඔවුන්ගේ අභිප්‍රායන්ට අන්‍යෝන්‍ය විශ්වාසය සහ විනිවිද පෙනෙන සාකච්ඡාවන් කේන්ද්‍රගත කෙරේ.

ඵලදායී කාර්යසාධන ඇගයීම සහ සාකච්ඡාව ශක්තිමත් කිරීම සඳහා, ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් තිරසාරත්ව කාර්යසාධන දත්ත ඉල්ලා සිටීමේ අයිතිය සහ H&M වෙනුවෙන් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීමේ පහසුකම් දැන්වීමක් නොමැතිවම පරීක්ෂා කිරීමේ අයිතිය H&M සතු වේ. H&M සාමාජිකයෙක් වන සංවිධාන නියෝජනය කරන තක්සේරුකරුවන් විසින් පවත්වනු ලබන තක්සේරු කිරීම්වලට ව්‍යාපාරික හවුල්කරුවන් යටත් විය හැකිය. එමනිසා, තක්සේරු කිරීමෙන්, නොදන්වා පරීක්ෂා කිරීමෙන්, සහ/ හෝ, H&M වෙත තිරසාරත්ව කාර්යසාධන දත්ත ඍජුව හෙළිදරව් කිරීමෙන් නිදහස් කිරීමක් ලිඛිතව H&M විසින් පැහැදිලිව තහවුරු කොට ඇත්නම් පමණක් මිස, ව්‍යාපාරික හවුල්කරුවන් විසින් H&M වෙනුවෙන් නිෂ්පාදනය හෝ සේවාවන් සිදුකරන ස්ථාන දැනුම් දීමට බැඳී සිටී. මෙම බැඳීමේ විෂයපථයට H&M වෙනුවෙන් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කරන උප-කොන්ත්‍රාත් සහ ගෘහස්ථ සේවාවන් ඇතුළත් වේ. බාහිර නිෂ්පාදන භාවිතා කරන ව්‍යාපාරික හවුල්කරුවන් හරිවැරදි බැලීමේ අරමුණ සඳහා අදාළ ලියකියවිලි පවත්වා ගන්නා බවට සහතික කිරීම අවශ්‍ය වේ.

මූලික අවශ්‍යතාවන්ට ස්ථාවර අනුකූලතාවය සහතික කිරීමට සහ අපේක්ෂිත කාර්යසාධන මට්ටම් ළඟා කර ගැනීමට අඛණ්ඩ වර්ධනය සබල කිරීමට හැකි වීම සඳහා, ව්‍යාපාරික හවුල්කරුවන් විසින් හොඳින් ක්‍රියාත්මක කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මේවාට සමාජීය, සෞඛ්‍ය, හා ආරක්ෂාව සහ පාරිසරික බලපෑම් හඳුනාගැනීමට, නිවැරදි කිරීමට සහ වර්ධනය කිරීමට අවශ්‍යවන පැහැදිලි ප්‍රතිපත්ති, වගකීම් සහගත ආයතනයක්, සිරිත් විරිත්, සන්නිවේදනය සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ ඇතුළත් වේ.

තිරසාරත්ව කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී, ව්‍යාපාරික හවුල්කරුවන් විනිවිදභාවයෙන් කටයුතු කරමින් H&M සිතාමතා නොමග නොයවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. විනිවිදභාවය නොමැතිවීම මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම උල්ලංඝනය කිරීමක් ලෙස සැලකේ. මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම සහ /හෝ දේශීය නීතියට එකඟවීමට ඇති ඇකැමැත්ත හෝ එය උල්ලංඝනය කිරීම් ව්‍යාපාර කටයුතු අඩුවීමට සහ අවසාන වශයෙන් H&M සමග ව්‍යාපාර සම්බන්ධතාවන් අවසාන කිරීමට හේතු වනු ඇත.

කර්මාන්ත අතර සහ ක්‍රමානුකූල තිරසාරත්වය පිළිබඳ අභියෝග හඳුනා ගැනීමේදී සහ ආමන්ත්‍රණය කිරීමේදී, විනිවිදභාවය ද අත්‍යවශ්‍ය ආරම්භක කරුණකි. සමාජීය සහ පාරිසරික තිරසාරත්වය වර්ධනය කිරීමට අවශ්‍යවන සාමූහික කටයුතු සහ ක්‍රමානුකූල වෙනස්වීම් ප්‍රවර්ධනය කිරීමට H&M ව්‍යාපාරික හවුල්කරුවන්, කර්මාන්ත, සිවිල් සමාජය සහ රාජ්‍යයන් සමග අඛණ්ඩව නියලී සිටී. අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ද එසේ කිරීම සඳහා H&M විසින් ධෛර්යමත් කරයි.

# 1 යහපත් සේවා ස්ථාන

## 1 A සෞඛ්‍ය හා ආරක්ෂාව

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 155 සහ 183, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 164 සහ 191 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
සේවා ස්ථානයේ ආරක්ෂාව සහ සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සැම අවස්ථාවකදීම ප්‍රමුඛත්වයක් විය යුතු අතර ආරක්ෂිත සහ සනීපාරක්ෂක සේවා පරිසරයක් ලබාදිය යුතුය. අවම වශයෙන්, මින් අදහස් වන්නේ;

- අදාළ වන්නාවූ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාවය දැක්වීම.
- අනාරක්ෂිත ගොඩනැගිලි නොමැතිවීම.
- උපද්‍රාව සහිත යන්ත්‍ර, උපකරණ සහ /හෝ කොටස්වලට අනාරක්ෂිත නිරාවරණය නොමැතිවීම.
- ගිනි ආරක්ෂාව ප්‍රමාණවත් උපකරණ සහ පහසු තත්ත්වයන්, විධිමත් ගිනි නිවීමේ පුහුණු සහ හදිසි පිටවුම් ස්ථාන සහ ගිනි උවදුරු වැලැක්වීම තුළින් නඩත්තු කිරීම.
- පිරිසිදු පානීය ජලය සහ වැසිකිළි පහසුකම් සඳහා ප්‍රවේශ තිබීම. ප්‍රමාණවත් වාතාශ්‍රය සහ උෂ්ණත්වය ලබා දීම.
- නවාතැන්/ නිවාස ලබාදීමේදී, සේවා ස්ථානයෙන් වෙන් කළ යුතු අතර, සෞඛ්‍ය හා ආරක්ෂාවට අදාළ වන්නා වූ ඉහත සියලූම මූලික අවශ්‍යතාවන් දි එයට අදාළ විය යුතුය.
- සේවය හේතුවෙන් ඇතිවන, හෝ සේවය හා සම්බන්ධ හෝ සේවය නිසා සිදුවන අනතුරු සහ තුවාල වැලැක්වීම හෝ සේවකයින්ට විධිමත් සහ වාර්තාගත සෞඛ්‍ය හා ආරක්ෂණ පුහුණු ලබා දීම.
- ගර්භණී සේවිකාවන්ගේ අවශ්‍යතා සාධාරණ අයුරින් ලබාදීම.

**අපේක්ෂිත:**
විශේෂයෙන් ගර්භණී සේවිකාවන් ඇතුළුව ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ දෘෂ්ටිකෝණයක් සහ යහපත් පරිචයක් යොදා ගනිමින් සේවකයින්ගේ දිගු කාලීන ආරක්ෂාව, යහපත් සෞඛ්‍ය සහ ශුභසාධනය සහතික කිරීම සඳහා සේවා යෝජකයා විසින් දිරිගන්වනු ලබන අතර ඒ සඳහා සක්‍රීයව කටයුතු කරනු ලබයි.

## 1B වෙනස්කම් සැලකීම, විවිධත්වය සහ සමානත්වය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 100, 111 සහ 159, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 90, 111 සහ 168 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
සැම සේවකයෙක්ටම සැම අවස්ථාවකදීම ගෞරව බහුමානයෙන් සලකනු ලැබේ. කිසිදු සේවකයෙක් නින්දා පැමිණවීමකට හෝ ශාරීරික දඬුවමකට යටත් නොවන අතර ශාරීරික, ලිංගික, මානසික හෝ වාචික හිරිහැර කිරීමකට හෝ අපයෝජනයකට යටත් නොවේ. බඳවා ගැනීමේදී, වැටුප් ගෙවීමේදී, පුහුණු සඳහා ප්‍රවේශ ලබාදීමේදී, උසස්කිරීමකදී, සේවය අවසන් කිරීමකදී හෝ විශ්‍රාම ගැන්වීමකදී ස්ත්‍රී පුරුෂභාවය හෝ ලිංගික හැඩගැස්ම, ජාතිය, වර්ණය, වයස, ගර්භණීභාවය, විවාහක තත්ත්වය, ආගම, දේශපාලන මතය, ජාතිකත්වය, ජන වර්ගය, කුලය, රෝග හෝ ආබාධ මත පදනම් වී වෙනස් ලෙස සැලකීමක්ට ලක්නොවිය යුතුය. පලිගැනීමේ අවදානමක් නොමැතිවම සේවකයින්ට තම පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මැසිවිලි විමසීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මකව විය යුතුය.

**අපේක්ෂිත:**
සේවා යෝජකයා විවිධත්වය සහ අංග සම්පූර්ණ සේවා ස්ථානයක් සඳහා සක්‍රීයව කටයුතු සිදු කරයි. සුළු ජාතීන් සහ/ හෝ අවාසි සහගත කණ්ඩායම් රැකියා සඳහා සලකා බැලිය හැකි ආකාරය සහ බාධක සක්‍රීයව මඟහරවා ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා සේවා යෝජකයා ප්‍රාදේශිය ප්‍රජාව සහ/ හෝ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සක්‍රීයව කටයුතු සිදු කරයි.

## 1 C පිළිගත් රැකියාව

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 122, 158 සහ 175, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 166 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
ඉටු කරනු ලබන සියලූම සේවා ජාතික නීතිය සහ ව්‍යවහාරය තුළින් ස්ථාපිත පිළිගත් රැකියා සම්බන්ධතාව මත පදනම් විය යුතුය. සැම සේවකයෙකුටම රැකියාව පිළිබඳ කොන්දේසි තමන්ගේම භාෂාවෙන් දක්වා ඇති ලිඛිත ගිවිසුමක් සඳහා හිමිකමක් ඇත. විධිමත් රැකියා සම්බන්ධතාවයෙන් ඇතිවන කම්කරු හෝ සමාජ ආරක්ෂක නීති සහ රෙගුලාසි යටතේ සේවකයින් සඳහා වන බැඳීම් ගිවිසුම, ස්ථිර කාල ගිවිසුම් මත පමණක් ශ්‍රමය භාවිතය තුළින් හෝ දක්ෂතා බෙදා ගැනීමට හෝ ස්ථිර රැකියා ලබාදීමට කිසිදු අදහසක් නොමැති ආධුණිකත්ව යෝජනා ක්‍රම තුළින් මඟ හැරිය නොහැකිය.

**අපේක්ෂිත:**
සේවා යෝජකයා රැකියා පිළිබඳ ස්ථිර කාල ගිවිසුම් භාවිතය සීමා කිරීමට නීතියෙන් අවශ්‍ය කරන දෙයට වඩා පියවර ගනී. සමාජ ආරක්ෂක පද්ධති පහත වැටෙන රටවල්වල, වෛද්‍ය සහ විශ්‍රාම රක්ෂණය ඇතුළුව සේවකයින් සඳහා සේවා යෝජකයා විකල්ප රක්ෂණ ලබා දේ.

## 1D සාධාරණ ජීවන වැටුප සහ ප්‍රතිලාභ

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 131 සහ 183, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 135 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
සම්මත සේවා සතියක් සඳහා ගෙවන වැටුප් සහ ප්‍රතිලාභ අවම, ජාතික නීති මට්ටම, කර්මාන්ත මට්ටමක් හෝ සාමූහික කේවල් කිරීමේ ගිවිසුමක් යන දෙකෙන් ඉහළ දෑ සපුරාලයි. ඕනෑම අවස්ථාවකදී සාධාරණ ජීවන වැටුපක් සැමවිටම සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල මූලික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් විය යුතු අතර සමහර අභිමතානුසාරී ආදායම් ලබා දේ. සියලුම වැටුප් විධිමත් පදනමක් මත ගෙවිය යුතු අතර, ගෙවීම් කාලසීමාවක් සඳහා වැටුප් පිළිබඳ විස්තර ලිඛිතව සහ අවබෝධ කරගත හැකි ආකාරයෙන් සැපයිය යුතුය. නීතිය හෝ ගිවිසුම විසින් අවශ්‍ය කරන සියලුම ප්‍රතිලාභ ලබා දේ. විනයානුකූල ක්‍රියාමාර්ගයක් ලෙස වැටුප්වලින් අඩුකිරීම සඳහා අවසර නොමැත. සේවකයින්ට නීතියෙන් හිමිකම් ඇති ඕනෑම වර්ගයක වැටුප් සහිත නිවාඩු ලබා දෙන අතර ඒ සඳහා නිවැරදිව ගෙවීම් සිදු කරනු ලබයි.

**අපේක්ෂිත:**
සේවා යෝජකයා විසින් සේවකයින්ගේ නිපුණතා සහ පළපුරුද්ද පිළිබිඹු කරන ගෙවීම් ව්‍යුහයක් යොදා ගනී. ගෙවනු ලබන වැටුප සේවකයින්ගේ මූලික අවශ්‍යතා සපුරාලන බවට අවබෝධ කර ගැනීම පිණිස සේවා යෝජකයා විසින් විධිමත් පරිදි සේවක සමීක්ෂණ පවත්වනු ලැබේ. අමතර අවශ්‍යතා අවබෝධ කර ගැනීම පිණිස, පුළුල්, අනුපූරක, සේවක අවශ්‍යතා තක්සේරුවක් නිතිපතා කරගෙන යනු ලැබේ.

## 1E වැඩකරන වේලාවන්

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 001, 014, 106 සහ 030 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
සතියක් තුළ වැඩකරන පැය ගණන මෙන්ම අතිකාල පැය ගණන් සේවකයින් සඳහා ඉහළ ආරක්ෂාවක් ලබා දෙන ජාතික නීතිය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති හෝ සාමූහික කේවල් කිරීම සහ ගිවිසුම් තුළ දක්වා ඇති දෑ සමඟ අනුකූල විය යුතුය. ඕනෑම අවස්ථාවකදී, සේවකයින් විධිමත් පදනමක් මත එක් සතියකට පැය 48කට වැඩිපුර සේවය කිරීමට අවශ්‍ය නොවන අතර සෑම දින 7ක කාලසීමාවක් සඳහා අවම වශයෙන් එක් දිනක නිවාඩුවක් ලබා දිය යුතුය. ඕනෑම දින 7ක කාලසීමාවක් තුල මුළු පැය ගණන පැය 60 නොඉක්මවිය යුතුය. සිය කැමැත්තෙන් සිදු කරන අතිකාල පැය ගණන එක් සතියක් තුළ පැය 12 නොඉක්මවිය යුතු අතර, ඒ සඳහා සැමවිටම විධිමත් පරිදි ගෙවන අනුපාතයෙන් 125%කට වඩා නොඅඩු විය යුතු යයි නිර්දේශ කර ඇති අධිමිල අනුපාතයකට ගෙවීම් කළ යුතුය.

**අපේක්ෂිත:**
අතිකාල පැය වැළැක්වීම පිණිස නිෂ්පාදන සැලැස්ම, ධාරිතාව සහ නිමැවුම් මැනීමට සහ නියාමනය කිරීමට සේවා ස්ථානයේ නවීන ක්‍රමයක් පවත්නා බවට සේවා යෝජකයා විසින් තහවුරු කෙරේ.

## 1F රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 87, 98, 135 සහ 154,ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 135 සහ 143 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
සෑම සේවකයෙකුටම කිසිදු විරුද්ධත්වයක් හෝ වෙනසක් නොමැතිවම, වෘත්තීය සමිතියකට බැඳීමට හෝ තමන්ගේ කැමැත්ත අනුව වෘත්තීය සමිතියක් පටන් ගැනීමට හෝ සාමූහිකව කේවල් කිරීමට අයිතිය ඇත. සේවක නියෝජිතයින්ට විරුද්ධව නොසැලකිය යුතු අතර, සේවා ස්ථානය තුළ ඔවුන්ගේ නියෝජිත කාර්යයන් කරගෙන යාමට ප්‍රවේශයන් තිබිය යුතුය. රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස සඳහා අයිතිය ජාතික නීතිය විසින් සීමා කරනු ලැබ ඇති අවස්ථාවක, ස්වාධින සහ නිදහස් රැස්වීම් සහ කේවල්කිරීම් පිළිබඳ සමාන මාධ්‍යයක් සංවර්ධනය කිරීම සඳහා සේවා යෝජකයා ධෛර්යමත් කරන අතර බාධා කිරීමක් සිදු නොකරයි.

**අපේක්ෂිත:**
සමාජීය සාකච්ඡාවන් සඳහා පහසුකම් සැපයීමට සහ ප්‍රවර්ධනය කිරීමට සේවක නියෝජිතයින් සමඟ සේවා යෝජකයා විධිමත් පදනමක් මත කටයුතු සිදු කරයි.  සේවා යෝජකයා ශ්‍රම බලකායට අදාළ ගැටළු සක්‍රීයව ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය වෘත්තීය සමිති සමඟ සෘජුවම කටයුතු සිදු කරන අතර ඔහු හාම්පුතුන්ගේ සංගමයේ සාමාජිකයෙක්ද වේ.

## 1G ළමා ශ්‍රමය සහ තරුණ සේවකයින්

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 138 සහ 182, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 146 සහ 190 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

ළමා අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් සහ ව්‍යාපාර මූලධර්ම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය

**මූලික:**
ළමා ශ්‍රමය පිළි නොගනී. වයස අවුරුදු 15ට (හෝ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතියේ 138 ව්‍යතිරේඛය අනුව 14ට) වඩා අඩු කිසිදු පුද්ගලයෙක් හෝ සේවා නියුක්තිය සඳහා වන වයස අවුරුදු 15ට වඩා වැඩිනම් නීතිමය වයසට වඩා අඩු තරුණයින් සේවයේ නොයෙදිය යුතුය. අවුරුදු 18ට වඩා අඩු පුද්ගලයින්ගේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් සියලුම නීතිමය සීමාවන් අනුගමනය කරනු ලැබේ. ඔවුන් ආපදා සහිත වැඩවලින් රාත්‍රී වැඩ මුරවලින් සහ ඔහුන්ගේ සංවර්ධනය අවහිර කරන හෝ යම් කායික අනතුරු ඇතිවන වැඩවලින් ආරක්ෂා කළ යුතුය.

රැකියා කිරීම සඳහා වන නීතිමය වයසට පහල කිසිවෙක් බඳවා නොගන්නා බව තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. සේවා ස්ථානය තුළ වැඩකරමින් සිටින ළමයෙක් හමුවූ විට ඔහුට හෝ ඇයට ගුණාත්මක අධ්‍යාපනයක් කරා යාමට සහ එහි රැඳී සිටීමට හැකිවන පරිදි ඔවුන්ට සංක්‍රාන්ති වැඩපිළිවෙලක් ලබාදෙන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සේවා යෝජකයා විසින් සංවර්ධනය කිරීම, හෝ ඒවාට සහභාගිවීම සහ දායකවීම සිදු කරයි. ළමයාගේ වයසට සහ සෞඛ්‍ය සංවර්ධනයට උපකාරීවන ආකාරයෙන් ළමයාගේ දෙමව්පියන් සහ/ හෝ භාරකරු සහ ළමයා සමඟ සාකච්ඡා කිරීම මගින් ළමයාගේ උපරිම යහපත පිණිස සැමවිටම යොදා ගත යුතුය.

**අපේක්ෂිත:**
ළමා ශ්‍රමය සහ තරුණ විරැකියාව ආමන්ත්‍රණය කිරීම සඳහා අධ්‍යාපනය සහ තිරසාර විසඳුම් වැඩි දියුණු කිරීමට ප්‍රාදේශීය ප්‍රජාවන් සහ පාර්ශවකරුවන් සමඟ සේවා යෝජකයා සක්‍රීයව කටයුතු කරයි.

## 1H බලාත්කාර, බැඳුණු, සිරගත සහ නීතිවිරෝධි ශ්‍රමය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 29 සහ 105, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශ 35 පිළිගැනීම මත අපගේ ප්‍රවේශය පදනම් වේ

**මූලික:**
බලාත්කාර, බැඳුණු, සිරගත සහ නීතිවිරෝධි ශ්‍රමය පිළිගනු නොලැබේ. ගිවිසුම්ගත ශ්‍රමය කුලියට ගන්නේ නම්, සේවා යෝජකයා බඳවාගැනීමේ ගාස්තු ඇතුළුව ගිවිසුම් මත රැකියාව සඳහා සුදුසුකම් ලබන ගාස්තු ගෙවීම සඳහා සහ/ හෝ විදේශීය සේවකයින් සඳහා වගකීමට බැඳී සිටී. සේවකයින් “තැන්පතු” හෝ අනන්‍යතා පත් සේවා යෝජකයා භාරයේ තැබීම අවශ්‍ය නොකරන අතර පිලිගත හැකි දැනුම්දීමකින් පසුව රැකියාවෙන් හැරයාමට නිදහස පවතී. ගමන් කිරීම සඳහාවන සේවකයාගේ නිදහස සීමා නොකෙරේ. වැටුපෙන් කිසිදු කොටසක් අත්හිටුවීම නො කෙරේ.

**අපේක්ෂිත:**
<u>පිළිගත් සේවා නියුක්තිය</u> බලන්න.

# 2 යහපත් පරිසර පද්ධති

## 2 A කාලගුණය සහ වායුවල තත්ත්වය මත බලපෑම

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව වායුවල තත්ත්වය, වායු විමෝචන සහ බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳව අදාළ වන්නා වූ සියලූම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යවසාය විසින් සියලූම මෙහෙයුම් සිදුකරනු ලබයි.

**අපේක්ෂිත:**
ව්‍යවසාය විසින් කාලගුණය වෙනස්වීම සහ වායුවල තත්ත්වය මත එහි බලපෑම සක්‍රියව අවම කරනු ලබන්නේ:

- බලශක්ති කළමනාකරණය සහ කාර්යක්ෂමතාවය තුළ අඛණ්ඩ වර්ධනය මගිනී.
- හරිතාගාර වායු (GHG) සහ පරිසරයට හානි ඇති කරන වෙනත් වායු විමෝචන අවමකිරීම හෝ තුරන් කිරීම, විමෝචන ගණනය කිරීම සහ GHG සම්මුතියට අනුව ඉලක්ක සකස් කිරීම[1].
- වගකීම් සහගතව බලශක්ති මූලාශ්‍ර තෝරා ගැනීම සහ අවම කාබන් තීව්‍රතාව සහ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර යොදා ගැනීම කරා ඉදිරියට යන ප්‍රවේශයක් ගැනීම.

## 2B ජල සම්පත් මත බලපෑම

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව ජලය සංරක්ෂණය සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව අදාළ වන්නා වූ සියලූම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යවසාය විසින් සියලූම මෙහෙයුම් සිදුකරනු ලබයි. අභ්‍යන්තර තෙතමන ක්‍රියාවලිය සහිත පහසුකම් මගින් ජලය ආපසු ලබාගැනීම සහ ප්‍රවාහ මීටරයන් විසින් ඉවත් කරන අපජලය මනිනු ලබන අතර අපජලය පිළිබඳ සම්පූර්ණ අභ්‍යන්තර ප්‍රතිකර්ම පහසුකම්[2] පිළිබඳ නීතිමය අවශ්‍යතාවන්ට හෝ BSR අපජලය ප්‍රමිති[3] යන දෙකෙන් වඩා ඉහල එක පිළිපැදිය යුතුය.

**අපේක්ෂිත:**
පහසුකමේ ජලය ආපසු ලබා ගැනීම අඛණ්ඩව අඩුකිරීම පෙන්වා දෙමින් ජල භාවිතය අඩු කිරීම සඳහා ව්‍යවසාය විසින් සක්‍රියව ක්‍රියාමාර්ග ගනු ලැබේ. ගෘහස්ථ අරමුණු සඳහා පමණක් ජලය භාවිතා කරන පහසුකම් සඳහා, (කරාම, වැසිකිළි, සිසිල් කිරීම) ජල කාර්යක්ෂම උපකරණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම ප්‍රමාණවත් වේ. වැසි ජල අස්වනු වැනි ජලය ඉතිරි කර ගැනීමේ ශිල්ප හැකි සෑම අවස්ථාවකදීම භාවිතා කරනු ලැබේ.

අභ්‍යන්තර තෙතමන ක්‍රියාවලිය සහිත පහසුකම් සඳහා;

- අභ්‍යන්තර ජල භාවිතය මැනීම සඳහා සුදුසු මට්ටමේ මාපක ක්‍රියාත්මක කරනු ලැබේ.
- ජල සම්පත් මත බලපෑම අඩු කිරීම සඳහා, පහසුකමේ ජල ශේෂය[4] තක්සේරු කළ යුතු අතර අඛණ්ඩ වර්ධනය පෙන්වාදීම සඳහා අඩුකිරීම පිළිබඳ සුදුසු ක්රියාමාර්ග ගත යුතුය.
- දිගු කාලීනව, වගකීම් සහගත ජල භාරකරුවෙක් ලෙස කටයුතු කරන්න. ව්‍යාපාරික හවුල්කරු තමන්ගේ මෙහෙයුම්වලින් ජලයට වන බලපෑම් අවම කිරීමට අමතරව, දිගු කාලීන සමාජීය පාරිසරික හා ආර්ථික අවශ්‍යතාවන් සපුරාලීමට ලබාගත හැකි ජල සම්පත් පාලනය කරනු ලබන බව සහතික කිරීම පිණිස ප්‍රාදේශිය පාර්ශවකරුවන් සමග සාමූහික ක්‍රියාවල නිරත වී සිටින බව මින් අදහස් වේ. ජල භාරකත්වය සහ ව්‍යාපාර සඳහා ඉන් අදහස් වන දෑ AWS අන්තර් ජාතික ජල භාරකත්ව ප්‍රමිති මගින් විස්තර කෙරේ[5].

## 2C රසායනික ද්‍රව්‍ය භාවිතය

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව රසායනික ද්‍රව්‍ය භාවිතය සහ බැහැරකිරීම පිළිබඳව අදාළ වන්නා වූ සියලූම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යවසාය විසින් සියලූම මෙහෙයුම් සිදුකරනු ලබයි. H&M වෙනුවෙන් යම් නිෂ්පාදනයක් සිදු කරන ව්‍යාපාරික හවුල්කරුවන් H&M හි සීමාකරන ලද ද්‍රව්‍ය ලැයිස්තුව (RSL) සහ නිෂ්පාදනයේදී සීමාකරන ලද ද්‍රව්‍ය ලැයිස්තුව (MRSL) තුළ විස්තර කර ඇති ගිවිසුම්ගතව එකඟ වූ අදාළ අවශ්‍යතාවන් සියල්ල සපුරාලිය යුතුය. භාවිතා කරන සියලූම රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම. පරිහරණය කිරීම, භාවිතය සහ බැහැරකිරීම එක් එක් රසායනික නිෂ්පාදනවල ආරක්ෂිත දත්ත පත්‍රිකාව (SDS) සමඟ අනුකූල විය යුතුය.

**අපේක්ෂිත:**
ව්‍යවසාය විසින් භාවිතා කරන සියලූම රසායනික නිෂ්පාදන හානිකර ද්‍රව්‍යයන්ගෙන් තොරය[6]. ව්‍යවසාය එහි රසායනික ද්‍රව්‍ය භාවිතය සහ මිනිසාට සහ පරිසරයට ඇති අවදානම අවම කරන හෝ “හරිත රසායන විද්‍යාව”[7].යොදා ගැනීම තුළින් සම්පත්වල කාර්යක්ෂමතාව වැඩිකරන වඩා හොඳින් ලබාගතහැකි රසායනික ද්‍රව්‍ය ආදේශක සහ විකල්ප ක්‍රියාවලිය සක්‍රීයව තක්සේරු කරයි.පූර්ව අවවාදාත්මක මූලධර්ම යොදා ගත යුතුය.

1. GHG Protocol Corporate Accounting and Reporting Standard (http://ghgprotocol.org/)
2 Full internal treatment means that the wastewater is only treated by the facility’s own internal Effluent Treatment Plant before being discharged to a natural water body
3 Industry standard for wastewater quality developed by a working group of several companies, coordinated by Business for Social Responsibility (BSR).
4 The AWS International Water Stewardship Standard, p.86
5 allianceforwaterstewardship.org
6 Hazardous substances means all those that show intrinsically hazardous properties (persistent, bio-accumulative and toxic (PBT); very persistent and very bioaccumulative (vPvB); carcinogenic, mutagenic and toxic for reproduction (CMR); endocrine disruptors (ED); or equivalent concern), not just those that have been regulated or restricted in other regions
7 Green chemistry refers to the design of chemical products and processes that reduce or eliminate the generation of hazardous substances, reduce waste and conserve energy and water.

## 2D අපද්‍රව්‍ය, නැවත-භාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව අදාළ වන්නා වූ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යවසාය විසින් සියලුම මෙහෙයුම් සිදුකරනු ලබයි. සේවාවන් ලබාගත හැකි අවස්ථාවේදී, සියලුම හානික අපද්‍රව්‍ය බලයලත් සමාගමක් හෝ බලපත්‍රලාභී භාරගන්නෙකු විසින් පරිහරණය කළ යුතුය.

**අපේක්ෂිත:**
අමු ද්‍රව්‍ය භාවිතය ප්‍රශස්තිකරණය තුළ අඛණ්ඩ වර්ධනයක් පෙන්වා දෙමින්, ප්‍රතිචක්‍රීයකරණය සහ අමු ද්‍රව්‍ය නැවත භාවිතය වැඩි කරමින් ව්‍යවසාය සක්‍රීයව එහි අලුත් අමු ද්‍රව්‍ය භාවිතය සහ පරිසරය කෙරෙහි එහි බලපෑම අවම කරයි. ඉඩම් පිරවීම සඳහා අපද්‍රව්‍ය තුරන් කිරීමේ ප්‍රගතිය ව්‍යවසාය විසින් පෙන්වා දෙන අතර චක්‍රීය ආර්ථික නව්‍යකරණයට අනුකූලව විසඳුම් සක්‍රීයව ලබා දේ.[8]

## 2E විශේෂක සහ ස්වභාවික ජන්මභූමි සංරක්ෂණය

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව අදාළ වන්නා වූ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යවසාය විසින් සියලුම මෙහෙයුම් සිදුකරනු ලබයි. අමු ද්‍රව්‍යවලට, අන්තරාදායක විශේෂකවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතියේ ලැයිස්තු ගත කරන විශේෂක (CITES)[9] හෝ IUCN රතු ලැයිස්තුවේ[10] ඉතා බරලපතල අන්තරාදායක, අන්තරාදායක හෝ හානිකර ලෙස දක්වා ඇති විශේෂක ඇතුළත් නොකළ යුතුය.

**අපේක්ෂිත:**
වඩාත් තිරසාර ගොවිපල සහ වන සංවර්ධන ව්‍යවහාරයන් සහතික කිරීම සඳහා තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනය කරන අමු ද්‍රව්‍ය ව්‍යවසාය ලබාගනී.

# 3 සත්ත්ව ශුභසාධනය

## 3 A සත්ත්ව පාලනය

**මූලික:**
වලංගු බලපත් පවත්වා ගැනීම ඇතුළුව අදාළ වන්නා වූ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාවය දක්වමින් ව්‍යාවසාය විසින් සියලුම මෙහෙයුම් සිදුකරනු ලබයි. එමෙන්ම H&M නිෂ්පාදන සඳහා සත්ත්ව මූලික අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහාවන අවශ්‍යතාවන් *H&M සත්ත්ව ශුභසාධන සහ අමුද්‍රව්‍ය සදාචාර ප්‍රතිපත්තිය* H&M නිෂ්පාදන සඳහා භාවිතා කරන වූල්, ලොම් සහ සිහින් පුළුන් නිපදවන සියලූම ගොවිපල *නිදහස් රාමු පහ* මත පදනම් වෙන *යහපත් සත්ත්ව පාලනය සඳහා H&M අවශ්‍යතාවන්* සපුරාලිය යුතුය.[11]

**අපේක්ෂිත:**
ව්‍යාවසාය සියලූම මූලාශ්‍ර නිෂ්පාදන සහ සේවාවන් සඳහා තමන්ට අයත් සැපයුම් දාමය තුළ යහපත් සත්ත්ව පාලනය සක්‍රියව ප්‍රවර්ධනය කරනු ලබයි. ශිෂ්ය බව සහතික කිරීමේ වැඩසටහනක් මඟින් තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනය කරන අමුද්‍රව්‍ය ලබා ගැනීමට සක්‍රියව සොයා බැලීම කටයුතුවලට ඇතුළත් වේ.[12]

## 3 B සත්ත්ව පරීක්ෂණ

**මූලික:**
ව්‍යාවසාය අදාළ වන්නා වූ සියලූම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලතාව දක්වයි. සත්ත්ව පරීක්ෂණ කිසිදු H&M නිෂ්පාදන මත යොදා ගනු නොලැබේ. සුවඳ විලවුන් ද්‍රව්‍ය සංවර්ධනය හෝ සුවඳ විලවුන් ද්‍රව්‍ය ආරක්ෂාව තක්සේරු කිරීමට අදාල 2009 මාර්තු 11 දිනෙන් පසු සත්ත්වයින් මත පරීක්ෂා කරනු ලැබ ඇති සුවඳ විලවුන් ද්‍රව්‍ය භාවිතය සඳහා H&M අවසර නොදේ. සුවඳ විලවුන් නිෂ්පාදන සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ අමු ද්‍රව්‍ය සැපයුම්කරුවන්, නිෂ්පාදකයින් හෝ නියෝජිතයින් විසින් එවැනි සත්ත්ව පරීක්ෂණ පැවැත්වීම නොකළ යුතුය.

**අපේක්ෂිත:**
සුවඳ විලවුන් නිෂ්පාදකයින් සඳහා ;

‘ H&M ට අමතරව සියලූම පාරිභෝගිකයින් සඳහා වන නිෂ්පාදන කෙරෙහි H&M අවශ්‍යතාවන් යොදා ගන්න.
‘ පාරිභෝගික ආරක්ෂාව තක්සේරු කිරීම සහතික කිරීමට විකල්ප, සත්ත්ව නොවන පරීක්ෂණ ක්‍රම අඛණ්ඩව යොදා ගන්න.

---

**8** ellenmacarthurfoundation.org
**9** cites.org
**10** iucnredlist.org

**11** Recommendations on animal welfare set out by the World Organisation by Animal Health (OIE) in their Animal Health Codes and the Farm Animal Welfare Committee (FAWC).
**12** Such as, but not limited to, Freedom Foods (freedomfood.co.uk), Humane Certified programs (certifiedhumane.org) and Textile Exchange's Responsible Down Standard and Responsible Wool Standard (responsibledown.org, responsiblewool.org)

# තිරසාරත්වය පිළිබඳ බැඳීම
# H&M ව්‍යාපාරික හවුල්කරු

As a Business Partner to H&M, we commit to complying with the **Fundamental** requirements on the issues outlined in this Sustainability Commitment, and to implement them in our operations as well as aim to realize them throughout our supply chain. H&M represents all affiliated companies and brands within the H&M Group.

H&M ව්‍යාපාරික හවුල්කරුවෙක් වශයෙන්, මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම තුල දක්වා ඇති කරුණු පිළිබඳව **මූලික** අවශ්‍යතාවන් පිළිපැදීමට සහ ඒවා අපගේ මෙහෙයුම්වලදී ක්‍රියාත්මක කිරීමට මෙන්ම අපගේ සැපයුම් දාමය පුරා ඒවා හඳුනාගැනීම සඳහා ඉලක්ක කිරීමට අපි බැඳී සිටිමු. H&M විසින් H&M සමූහය තුළ සියලූම අනුබද්ධිත සමාගම් සහ වෙළෙඳ නාම නියෝජනය සිදු කරනු ලබයි.

Furthermore, we understand that H&M has the ambition to engage and continue to grow with Business Partners that share H&M's sustainability ambition beyond mere compliance with the law to advance social and environmental sustainability, stated as **Aspirational** performance criteria in this Sustainability Commitment.

එමෙන්ම, මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම තුල **අපේක්ෂිත** කාර්යසාධන නිර්ණායක ලෙස දක්වා ඇති උසස් සමාජීය සහ පාරිසරික තිරසාරත්වය සඳහාවන නීති සමඟ හුදෙක් අනුකූලතාවය දැක්වීමට වඩා H&Mහි තිරසාරත්ව අභිලාෂය හුවමාරු කර ගන්නා ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ කටයුතු කරමින් අඛණ්ඩව වර්ධනය වීම සඳහා H&M වෙත අභිලාෂය ඇති බව අපි අවබෝධ කර ගනිමු.

Therefore, as a Business Partner to H&M, we agree to be monitored and evaluated on our sustainability performance within the areas described in this Sustainability Commitment.

එමනිසා, H&M ව්‍යාපාරික හවුල්කරුවෙක් වශයෙන්, මෙම තිරසාරත්වය පිළිබඳ බැඳීම තුල විස්තර කර ඇති ක්ෂේත්‍රයන්හි අපගේ තිරසාරත්ව කාර්යසාධනය පිළිබඳ නියමනය කිරීමට සහ ඇගයීමට අපි එකඟ වෙමු.

We recognize that this Sustainability Commitment is drafted and valid in the English language. Where there are different language versions of this document these shall be considered translations of convenience only and the English version will prevail in any case of discrepancy.

මෙම අචාර ධර්ම සංග්‍රහය කෙටුම්පත් කරන බවත් ඉංග්‍රීසි භාෂාව වලංගු වන බවත් අපි පිළිගනිමු.  විවිධ භාෂාවලින් මෙම පිටපතෙහි පිටපත් ඇති අතර, මේවා පහසුව සඳහා පමණක් සිදුකළ පරිවර්තන ලෙස සැලකිය යුතුය. මේවා අතර යම් වෙනස්වීමක් ඇති අවස්ථාවකදී ඉංග්‍රීසි පිටපත බලාත්මක වේ.

**Place and date /** ස්ථානය සහ දිනය

**Company name /** සමාගමේ නම

**Signature /** අත්සන

**Company stamp /** සමාගමේ මුද්‍රාව :

**Name in printed letters and title /** නම සහ තනතුර මුද්‍රිත අකුරුවලින්